**සටහන 02**

# නිෂ්පාදන සාධක වෙළෙඳපොළ හැසිරීම

**සාධක වෙළෙඳපොළ** යනු :

භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී යොදා ගැනෙන නිෂ්පාදන සාදක වර්ග 04 කි. එනම්, භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වයයි. මෙවැනි නිෂ්පාදන සාධක විකිණීමත්, මිලට ගැනීමත් සිදු කෙරෙන වෙළෙඳපොළ මේ නම් වේ.

භාණ්ඩ වෙළෙඳපොළෙහි භාණ්ඩවලට ඇති ඉල්ලුම හා සැපයුම මත භාණ්ඩ මිල තීරණය වන්නා සේ ම සාධක වෙළෙඳපොළෙහි සාධකවලට ඇති ඉල්ලුම හා සැපයුම මත සාධක මිල තීරණය වේ. සාධක සේවා විකිණීමට ඉදිරිපත් වන්නේ කුටුම්බ අංශය වන අතර, සාධක සේවා මිලට ගනු ලබන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතන විසිනි.

යම් ආයතනයක් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය වැනි නිෂ්පාදන සාධක භාවිත කොට නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම මත එම **සාධකවලට ඇති ඉල්ලුම තීරණය වේ.** එබැවින් නිෂ්පාදන සාධක සඳහා ඇති ඉල්ලුම ව්‍යුත්පන්න ඉල්ලුමකි. වී වෙළෙඳපොළෙහි පවත්නා ඉල්ලඅම මත වී නිෂ්පාදනය කිරීමට යොදා ගන්නා නිෂ්පාදන සාධක වන භූමියත් ශ්‍රමයත් ප්‍රාග්ධනයත් සඳහා ගොවීන්ගෙන් ඉල්ලුමක් ඇතිවීම නිදසුනකි.

උදා

- ඇඟලුම් සඳහා ඇති ඉල්ලුම මත ඒවා නිපදවන ශ්‍රමිකයන්ට ඉල්ලුමක් ඇති වීම
- කෘෂිභෝගවලට ඇති ඉල්ලුම මත භූමියට ඉල්ලුමක් ඇති වීම

**සාධක මිලඃ** සාධක සේවා නියුක්ත කරගැනීම වෙනුවෙන් සාදක හිමියනට කරන ගෙවීම මේ නම්.

**භූමිය - බදු කුලී**

**ශ්‍රමය - වැටුප්**

**ප්‍රාග්ධනය - පොළී,**

**ව්‍යවසායකත්වය - ලාභ**

SLCJAYASINGHE

**සාධක ඉල්ලුම**

නිෂ්පාදන ආයතන සාධක සඳහා ඉල්ලුම සාධක මිල සැලකිල්ලට ගෙන තීරණය කරන අතර සාධක මිල වැඩි නම් සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු වන අතර සාධක මිල අඩු නම් සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි වේ. සාධක මිල හා සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අතර **ප්‍රතිලෝම සම්බන්ධයක්** පවතී. එබැවින් සාධක සඳහා වන ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ. මේ අනුව යම් නිෂ්පාදන ආයතනයක් යම් සාධකයකින් වැඩිපුර ඉල්ලන්නේ එකී සාධකය නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීම වෙනුවෙන් මුළු නිෂ්පාදනයට එකතුවන අතිරේක ඒකකවල වටිනාකම (ආන්තික නිෂ්පාදිතයේ වටිනාකම) අවම වශයෙන් එම සාධකයට ගෙවන මිලට සමාන වන්නේ නම් පමණි. එබැවින් සාධක සඳහා ඉල්ලුම වන්නේ එම සාධකවල ආන්තික ඵලදායීතාවයි.

**උදා :** ශ්‍රමිකයකුගේ වැටුප් ඉහළ යත් ම ශ්‍රම ඉල්ලුම අඩු වන අතර, වැටුප් පහළ යන විට ශ්‍රම ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. ශ්‍රම ඉල්ලුම් වකය පහත පරිදි වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.

භාණ්ඩ වෙළෙඳපොළ එක් එක් පාරිභෝගිකයාගේ ඒ ඒ භාණ්ඩය සඳහා වන ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් වෙළෙඳපොළ අදාළ භාණ්ඩය සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය නිර්මාණය කරගත් අයුරින්ම සාධක වෙළෙඳපොළ එක් එක් ආයතනයේ ඒ ඒ සාධකය සඳහා වන ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් අදාළ සාධකය සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ලබාගත හැකිය.

පහත දැක්වෙන්නේ ශ්‍රම ඉල්ලුම් වක්‍රයයි.



**සාධක සැපයුම**

සාධක මිල සැලකිල්ලට ගනිමින් සාධක හිමියන් සාධක සපයනු ලබයි. සාධක මිල වැඩි වන විට සාධක සැපයුම වැඩි වන අතර, සාධක මිල අඩු වන විට සාධක සැපයුම අඩු කරයි. මෙම නිසා සාධක මිල හා සාධක සැපයුම් කරන ප්‍රමාණය අතර **අනුලෝම සම්බන්ධයක්** පවතී. එබැවින් සාධක සඳහා වන සැපයුම් වක්‍රය වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ

**උදා :**වැටුප් වැඩි වත් ම ශ්‍රමිකයන් වැඩියෙන් ශ්‍රමය සැපයීමට කැමැත්තක් දක්වන අතර වැටුප් අඩු වත්ම ශ්‍රම සැපයුම අඩු කිරීමට පෙලඹෙති.

පහත දැක්වෙන්නේ ශ්‍රම සැපයුම් වක්‍රයයි.




**සාධක වෙළෙඳපොළ සමතුලිතය**

සාදක ඉල්ලුම්කරුවන්ගේ හා සාදක සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරීත්වය නිසා සාදක වෙළෙඳපොළ සමතුලිතය නිර්මාණය වේ. ඒ අනුව සාධක මිල සහ සමතුලිත සාධක ප්‍රමාණය තීරණය වේ.

පහත දැක්වෙන්නේ ශ්‍රම වෙළෙඳපොළ සමතුලිතයයි.




ඉහත රූප සටහනට අනුව,

a ලක්ෂ්‍යයේ දී ශ්‍රම වෙළෙඳපොළ සමතුලිත අවස්ථාව

$W_1$ සමතුලිත වැටුප් අනුපාතිකය

(අනෙකුත් සාධක සම්බන්ධවද මේ ආකාරයට ක්‍රියාකාරිත්වය සිදුවේ.)

**සාධක ඉපැයීම්**

කිසියම් සාධක සේවාවක මිල යනු එම සාධකයේ ඉපැයීම යි. මෙම සාධක ඉපැයීම් ආකාර දෙකකි.

- ✓ සංක්‍රාම ඉපයීම
- ✓ ආර්ථික බදු කුලිය

**සංක්‍රාම ඉපයීම්**

කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා එම සාධකය අපේක්ෂා කරන අවම මිල එම සාධකයේ සංක්‍රාම ඉපයීම වේ. එනම් යම් සාධකයක් සේවා නියුක්ත කරවීම සඳහා ගෙවිය යුතු අවමය සංක්‍රාම ඉපයීම් වේ. සාධකයකට එම අවම ප්‍රමාණයවත් ලබා ගත නොහැකි නම් එම සාධකය තව දුරටත් එම කාර්යයේ නිරත නොවී එම ඉපයීම් ලබා ගත හැකි වෙනත් භාවිතයක් කරා ඉවත් වී යාමට පුළුවන. එක් නිෂ්පාදන කාර්යයක සිට තවත් නිෂ්පාදන කාර්යයකට සම්පත් මාරු වීම වැළැක්වීම සඳහා සාධකයකට අවශ්‍ය අවම ඉපැයුම සංක්‍රාම ඉපැයුම් මගින් පිළිබිඹු කෙරේ. එහෙයින් සාධකයක වර්තමාන භාවිතයේ ආවස්ථික පිරිවැය සංක්‍රාම ඉපැයුම් මගින් පෙන්නුම් කරයි. කිසියම් සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා ගත හැක්කේ එම ආවස්ථික පිරිවැය පියවීමට ප්‍රමාණවත් ආදායමක් ලැබේ නම් පමණි.

**ආර්ථික බදු කුලිය**

කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා ගැනීම සඳහා අපේක්ෂා කරන අවම ගෙවීම ඉක්මවා ආදායමක් උපයා ගන්නේ නම් එම අතිරික්ත ආදායම ආර්ථික බදු කුලිය වේ. යම් සාධකයක වර්තමාන ඉපයුම වූ සංක්‍රාම ගෙවීම් ඉක්මවා යන්නේ නම් ඒ ඉක්මවා යන ප්‍රමාණය ආර්ථික බදු කුලියෙන් පෙන්නුම් කරයි.

උදා: කිසියම් පුද්ගලයකුට වර්තමාන සේවා නියුක්තිය මගින් දිනකට රුපියල් 1000ක් ද, ඊළඟට කළ හැකි රැකියාව තුළින් දිනකට රුපියල් 800ක්ද ඉපයීමට හැකි බව සිතමු.

මේ අනුව ඔහුගේ,

- ✓ සංක්‍රාම ඉපයීම් රුපියල් 800
- ✓ ආර්ථික බදු කුලිය රුපියල් 200

SUJANASINGHE

පහත දැක්වෙන්නේ ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් ප්‍රස්තාර සටහනකින්




S - සාධක සැපයුම් වක්‍රය (සාධක සැපයුම් වක්‍රයෙන් එම සාධකයේ ඒ ඒ ඒකකය සැපයීම සඳහා සැපයුම්කරුවා බලාපොරොත්තු වන අවම මිල එනම් ආවස්ථික පිරිවැය පෙන්නුම් කෙරේ.)

P3 - සමතුලිත මිල

Q3 - සමතුලිත ප්‍රමාණය

OP3 EQ3 සෘජුකෝණාස්‍රයේ කේෂ්ත්‍රඵලයෙන් - Q3 ප්‍රමාණය සේවා නියුක්ත වන විට සාධකය සඳහා ලැබෙන මුළු ඉපැයීම් ප්‍රමාණය

OP3 E ත්‍රිකොණයේ ක්ෂේත්‍රඵලය - Q3 ප්‍රමාණය සේවා නියුක්ත කිරීමෙන් ලැබෙන ආර්ථික බදු කුලිය

OE Q3 ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය - Q3 සේවා නියුක්තිය කිරීමෙන් ලැබෙන සංක්‍රාම ඉපැයුම්

Q1 සේවා නියුක්ත කරවීම සඳහා සාධක හිමියන්ට ගෙවිය යුතු අවම මිල එනම් සංක්‍රාම ඉපැයුම P1 එහෙත් Q1 සේවා නියුක්ත කරන විට එම සාධකයේ වෙළෙඳපොළ මිල P3 වේ.මේ නිසා P3 - P1 අතර වෙනස ආර්ථික බදු කුලිය වේ.

මේ ආකාරයෙන් ම Q2 සේවා නියුක්ත කරන විට සංක්‍රාම ඉපැයුම් P2 වේ. P3 - P1 අතර වෙනස ආර්ථික බදු කුලිය වේ.

Q3 සේවා නියුක්ත කරන විට ගෙවිය යුතු අවම මිල P3 වේ. එය සාධකයේ වෙළෙඳපොළ මිලට සමාන හෙයින් එහි දී මුළු ඉපැයුම සංක්‍රාම ඉපැයුම් වේ.

SDCJAYASINGHE

**සාධක සැපයුම් නම්‍යතාව**

සාධක සැපයුම් නම්‍යතාව විවිධ වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම්හි ද වෙනස්කම් ඇතිවේ.

පහත දැක්වෙන්නේ විවිධ සාධක සැපයුම් නම්‍යතා අවස්ථාවල දී ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම්වල හැසිරීම.

සාධක සැපයුම **ඒකීය නම්‍ය** අවස්ථාවක සාධක ඉපැයුම්

- ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් එකිනෙකට සමාන වේ.




ඉහත රූප සටහනේ 0P1EQ1 සෘජුකෝණයේ ක්ෂේත්‍රඵලය සාධකයේ මුළු ඉපැයුම් වේ. මුළු ඉපැයුම්වලින් 0P1E ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය ආර්ථික බදු කුලිය

0E Q1ත්‍රිකෝණයේ ක්ෂේත්‍රඵලය සංක්‍රාම ඉපැයුම් ද වේ.

0P1E සහ 0E Q1ත්‍රිකෝණ දෙකෙහි කෙෂ්ත්‍රඵලය එකිනෙකට සමාන වන අතර එයින් පිළිබිඹු වන්නේ ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් එකිනෙකට සමාන වන බව යි.

සාධක සැපයුම **පූර්ණ අනම්‍ය** අවස්ථාවක

- මුළු සාධක ඉපැයුම් ආර්ථික බදු කුලියෙන් සමන්විත වේ.



මෙහි දී

Q1   සාධකයේ මිල ශූන්‍ය වුව ද එම සාධකයේ සැපයුම් ප්‍රමාණය

P1   වෙළෙඳපොළ සාධක ඉල්ලුම හා සැපයුම මගින් තීරණය වූ මිල

0P1EQ1   මුළු ඉපැයුම් (එම මුළු ඉපැයුම ම ආර්ථික බදු කුලියක් වේ.)

සාධකයේ ඉපැයුම මුළුමනින් ම ආර්ථික බදු කුලියක් වීමට හේතුව වන්නේ පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාවේ දී Q1 ප්‍රමාණයක් සේවා නියුක්ත කිරීම සඳහා ගෙවිය යුතු මිල ශූන්‍ය වීම යි.

සාධක සැපයුම **පූර්ණ නම්‍ය** අවස්ථාවක

- මුළු ඉපැයුම් සංක්‍රාම ඉපැයුම් වේ.




P1  මිලට ඕනෑ ම සාධක ප්‍රමාණයක් සැපයීමට සාධක හිමියෝ කැමැත්තක් දක්වති.

0P1 EQ1   මුළුමනින්ම සංක්‍රාම ඉපැයුම්

(නිදසුන් - හම්බු සාධකය සැලකිල්ලට ගත හොත් එක් වගාවකින් වෙනත් වගාවකට මාරු විය හැකි වීම)

සාධක සැපයුම **අනම්‍ය** අවස්ථාවක :

- මුළු ඉපැයුම්වලින් වැඩි කොටසක් ආර්ථික බදු කුලියෙන් ද , අඩු කොටසක් සංක්‍රාම ඉපැයුම් වේ.



0P1EQ1 සෘජුකෝණය මුළු සාධක ඉපැයුම්

0P1EQ ආර්ථික බදු කුලියක්

QEQ1 සංක්‍රාම ඉපැයුමක්

0P1EQ ක්ෂේත්‍රඵලය QEQ1 ක්ෂේත්‍රඵලයට වඩා වැඩි වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ අනම්‍ය සාධක සැපයුමක දී ආර්ථික බදු කුලිය සංක්‍රාම ඉපැයුම්වලට වඩා වැඩි බව යි.

සාධක සැපයුම **නම්‍ය** අවස්ථාවක

- වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම් වන අතර අතර අඩු කොටස ආර්ථික බදු කුලිය




0P1EQ1 මුළු සාධක ඉපැයුම්

NP1E ආර්ථික බදු කුලිය

0NEQ1 සංක්‍රාම ඉපැයුම් වේ.

0NEQ1 ක්ෂේත්‍රඵලය NP1E ක්ෂේත්‍රඵලයට වඩා වැඩි වීමෙන් නම්‍ය සාධක සැපයුමක දී වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම් බව පැහැදිලි වේ.

ක්‍රියාකාරකම 02

1. ඉහත සටහන කියවා නිෂ්පාදන සාධක වෙළෙඳපොළ පිළිබඳව ඔබ විසින් ලබාගත් දැනුම මත පදනම්වී පහත තොරතුරු ඇසුරින් පුද්ගල ශ්‍රම සැපයුම් වක්‍රය නිර්මාණය කරන්න.

- කිසියම් පුද්ගලයෙකුට වැඩ කිරීමට දිනකට පැය 24 ක් ඇත.ඔහු තම කාලය වැඩ කිරීම හා විවේකීව හිඳීම වෙනුවෙන් යොදවයි. ඒ අනුව ඔහුගේ පැයක වැටුප රුපියල් 2 000.00 කි. ඔහුගේ ආදායම් රේඛාව A-B ලෙස ලබාගන්න.
- ඔහු දිනකට පැය 10ක් පමණක් වැඩ කිරීමට තීරණය කළේ නම් එම ලක්ෂ්‍යය A-B රේඛාව මත x යයි ලකුණු කරන්න.

SDCJAYASINGHE

- ඔහුගේ දිනක වැටුප රුපියල් 3 000.00ක් වශයෙන් ඉහළගියේ නම් ඔහුගේ නව ආදායම් රේඛාව A-C වශයෙන් අඳින්න.
- මෙම තත්වයය මත ඉහත පුද්ගලයා පැය 12ක කාලයක් සේවය කිරීමට තීරණය කළේ නම් ඒ බව Y ලක්ෂ්‍යයෙන් පෙන්වන්න.
- තවදුරටත් මෙම පුද්ගලයාගේ දිනක වැටුප රුපියල් 4 000.00 දක්වා ඉහළ ගියේ නම් ඔහු දිනකට පැය 10ක් පමණක් සේවයේ නිරතවන Z ලක්ෂ්‍යය අඳින්න.
- ඉහත වැටුප් මට්ටම්ද වැඩ කළ කාලයද සළකා මෙම පුද්ගලයාගේ ශ්‍රම සැපයුම් වක්‍රය අඳින්න.

2. නිෂ්පාදන සාදක වෙළෙඳපොළ ආශ්‍රිතව පසුගිය වසර 10ක අපොස (උ/පෙළ) විභාග ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු 2020.05.04 වන දින හෝ ඊට පෙර sdcjayasinghe@gmail.com යන විද්‍යුත් ලිපිනයට ඔබගේ නම හා පංතිය සඳහන්කර යොමු කරන්න.**

SDCJAYASINGHE